**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - 2015**

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් ප්‍රත්‍යාගණනය කිරිමේදී වත්කම්වල ඵලදායි ජිවකාලය සමාලෝචනය කළයුතු නමුත් 2014 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරිමේදී ඒවායේ ප්‍රයෝජනවත් ජිවිත කාලය ඇගයීමට ලක් කර නොතිබුණි.

(ආ) ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කළ යුතු වුවද, මිලදීගත් වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය නොකර ඉවත්කරන වර්ෂය සඳහා මුළු වර්ෂයටම ක්ෂය ප්‍රතිපාදනය කිරීමේ ප්‍රතිපත්තිය ආයතනය විසින් අනුගමනය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී ලද ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කරගෙන මිලදීගත් වත්කම්වලට අදාළ ක්‍රමක්ෂය ගැලපීමේදී ඒ වන විටත් මූල්‍ය ප්‍රකාශනයන්ට ගලපා තිබූ දේශීය හා විදේශීය ප්‍රදානයන්ට අදාළ රු.111,606,435 ක්වූ ක්‍රමක්ෂය නැවත වරක් ගලපා තිබුණි.

(ආ) බේරුවල මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සහ සුනාමි මධ්‍යස්ථානය 2014 මාර්තු සිට භාවිතයට සුදුසු තත්ත්වයට පත්වී තිබුණද, එදින සිට ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබීම හේතුවෙන් 2014 හා 2015 වර්ෂ සඳහා ක්ෂය පිළිවෙලින් රු.1,193,373 කින් හා රු.1,591,165 කින් අඩුවෙන් ක්ෂය දක්වා තිබුණි.

(ඇ) 99 අවුරුදු බදු ගිවිසුමක් යටතේ නියෝජිතායතනය වෙත පවරා දී තිබූ ප්‍රත්‍යාගණිත අගය රු.14,220,234 ක් වූ කඩොල්කැලේ පර්යේෂණ මධ්‍යස්ථානය ඉකුත් වර්ෂයේදී රු.198,000,000 කට නැවත ප්‍රත්‍යාගණනය කර තිබුණද, ඊට අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකර නොතිබුණි.

(ඈ) වත්කමේ කාණ්ඩය නිශ්චිතව හඳුනා නොගෙන ක්ෂය ප්‍රතිපාදන ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 225,778 ක් වැඩියෙන් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියෝජිතායතනයේ අවශ්‍යතාවලට අනුකූල නොවූ පරිගණක මෘදුකාංග පද්ධතියක් වෙනුවෙන් බාහිර ආයතනයක් වෙත ගෙවා තිබූ රු.272,160 ක් වූ අත්තිකාරම් මුදල වසර 05 ක් ගතවී ඇතත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ධීවර වරායන් 06 ක් සංවර්ධනය කිරීම සඳහා වූ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකින් ලැබිය යුතු රු.1,612,898 ක් අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය සහ පරිගණක හා මෘදුකාංග සම්බන්ධයෙන් වූ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | 1994 ජූනි මස 14 දිනැති අංක පීඊඩී/95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී නියෝජිතායතනයේ ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් 19 ක් සඳහා අංශ ප්‍රධානී දීමනා ලෙස රු. 456,533 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත යැපෙන රාජ්‍ය සංස්ථා සඳහා අවශ්‍ය තක්සේරු සේවාවන් රජයේ තක්සේරුකරු වෙතින් ගාස්තු ගෙවීමකින් තොරව ලබාගත යුතු වුවද, නියෝජිතායතනය විසින් තක්සේරු සේවාවන් ලබාගැනීම වෙනුවෙන් පෞද්ගලික පාර්ශවයක් වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.775,000 ක් ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

වාහනයේ අළුත්වැඩියා කටයුතු සතුටුදායක ලෙස සිදුකර නොමැති බව ප්‍රවාහන නිලධාරී විසින් දන්වා තිබියදී සමාලෝචිත වර්ෂයේදී වාහන අළුත්වැඩියා සඳහා රු.501,619 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,480,455 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.74,938,175 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.54,457,720 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩල පාරිශ්‍රමික රු.72,575,776 කින් වැඩි වුවද, රජයේ

ප්‍රදානයන් රු.70,297,526 කින් වැඩිවීම හා ප්‍රත්‍යාගණන අලාභය රු.46,097,693 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඌනතාවය අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2014 හා 2015 වර්ෂවලදී ඌනතාවයේ අඩුවීමක් දක්නට ලැබුණි. ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.152,754,450 ක්ව පැවති නියෝජිතායතනයේ දායකත්වය 2012 වර්ෂය තුල රු.123,494,212 ක් දක්වා අඩුවී තිබුණද 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල ක්‍රමිකව වර්ධනය වී 2015 දී දායකත්වය රු.336,240,797 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත අනුව නියෝජිතායතනයේ අරමුණු හා කාර්යයන් ලෙස ,

- ජලජ සම්පත් පිළිබඳ විෂයය සම්බන්ධයෙන් ජාතික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික විශේෂඥතාව යොදාගැනීම හා උපයෝගී කර ගැනීම සහතික කිරීම.
- ජලජ සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම , කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය අරභයා යොමුකරන ලද , ප්‍රධාන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වූ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා කරගෙන යාම; ඊට අදාළ තාක්ෂණික හා නෛතික කරුණු සම්බන්ධයෙන් උපදේශක හා අනුශාසක සේවා සැපයීම; එම කාර්යයන්හි නියැලුණු ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම; ඒ සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු හා දත්ත එකතු කිරීම , ව්‍යාප්ත කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා භාර ගැනීම, අවශ්‍ය පුහුණුව ලබාදීම සහ නියම කරන ලද සියළුම බලතල කාර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම දක්වා තිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවට අනුව නියෝජිතායතනයේ ක්‍රියාකාරකම් ඉටුකිරීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) මන්නාරම හා නිලාවේලි ප්‍රදේශවල මත්ස්‍ය පැවැත්ම සම්බන්ධයෙන් ජෛව විවිධාත්මක කරුණු හඳුනාගැනීම හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කළ රු.1,000,000 ක් වූ මුදලින් රු.884,292 ක් වැයකර තිබූ නමුත්, එකී ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූ පරිසර පද්ධතිය සම්බන්ධව සිතියමක් නිර්මාණය කිරීම හා ජෛව විවිධත්ව කරුණු පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම ඉටුකර නොතිබුණි.

(ii) කල්පිටිය ප්‍රදේශයේ මුහුදු කැස්බෑවන් අභිජනන මධ්‍යස්ථාන හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් විශේෂ අවස්ථා හඳුනාගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතිය සඳහා රු.600,000 ක් වෙන්කර තිබුණද රු.250,131 ක් වැයකර දත්ත රැස්කිරීම පමණක් සිදුකර තිබුණි. කැස්බෑවන් ව්‍යාප්තිය විද්‍යාත්මක ලෙස කළමනාකරණය කිරීම , කැස්බෑවන් සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම හා පරිසර හිතකාමී ලෙස සංචාරකයින් ආකර්ෂණය වන ආකාරයෙන් ප්‍රසිද්ධියක් ලබාදීම යන ක්‍රියාකාරකම් කිසිවක් ඉටුකර නොතිබූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අතරමග නැවතී තිබුණි. නමුත් ප්‍රගති සමාලෝචන වාර්තාවල භෞතික ප්‍රගතිය සියයට 96 ක් නිමකර ඇති බව දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී ප්‍රධාන වැඩසටහන් / ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 70 සිට සියයට 85

දක්වා වූ පරාසයක පැවතීමෙන් ඉලක්ක උපරිම අයුරින් ළඟාකරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2011 වර්ෂයේ සියයට 09 ක් වූ නියෝජිතායතනයේ ස්වයං උත්පාදිත ආදායමේ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය වනවිට සියයට 02 දක්වා අඩු වී තිබුණි. ස්වයං උත්පාදිත ආදායම ඉහළ නංවා ගැනීමට කළමනාකාරිත්වය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

ජංගම නොවන වත්කම් යටතේ දැක්වෙන රු. 53,400,900 ක් වූ ඉඩම්වල අයිතිය නියෝජිතායතනය වෙත පවරා ගැනීමට 2016 ජූලි වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.15,685,632 ක් වැයකර ඉදිකර තිබූ "තරණී" යාත්‍රාව මේ දක්වා අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබූ අතර, 2014 නොවැම්බර් 12 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී අදාළ නැව විකිණීමට කටයුතු කරන ලෙසට නියෝග කර තිබුණද 2016 අගෝස්තු 04 දින වනවිටත් විකුණා නොතිබුණි. තවද මෙම යාත්‍රාව ඉදිකළ දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු.7,663,375 ක් වූ පිරිවැයක් යාත්‍රාවේ නියුතු නිලධාරින්ගේ වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් දැරීමට සිදුවී තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියෝජිතායතනයේ අරමුණුවලින් බැහැරව රු.15,245,000 ක් වැයකර ඉදිකර තිබූ මත්ස්‍ය අලෙවි සැල 2014 මාර්තු 21 දින සිට කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම ඉදිකිරීම්වලට අදාළ ඉඩම නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරාගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් බෝට්ටු එන්ජින් දෙකක් මිලදී ගැනීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052 ක්ද නිෂ්පාදන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.2,902,938 ක්ද වැයකර තිබුණද එම නිෂ්පාදන කටයුතු අතරමඟ නතර කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය හඳුනානොගෙන මිලදීගෙන තිබූ රු.120,000 ක් වූ තන්දූරි උඳුන, රු.352,800 ක් වූ පිහන් සෝදන යන්ත්‍රය හා රු.100,000 ක් වූ ඇළුමිනියම් ඉනිමග 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2016 අගෝස්තු 31 දින දක්වාම භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2014 අප්‍රේල් මාසයේ රු.76,800 කට මිලදී ගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් විගණිත දිනය වූ 2015 අප්‍රේල් දක්වා භාවිතා කර නොතිබුණි.

**4.6 හඳුනාගන්නා ලද පාඩු**

-------------------------

2009 වර්ෂයේදී රු.411,000 කට මිලට ගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් ඇතුලත් කර තිබූ වටිනාකම රු.52,000 ක් වූ පරිගණකයක් 2012 වර්ෂයේදී අස්ථාන ගතවී තිබූ අතර අදාළ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

**4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

-----------------------------------------------------------------

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් පනාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක අයිතිය පවරාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.552,906 ක් වැයකර ඉදිකිරීම් සිදුකර තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් නියෝජිතායතනයේ සම්පත්**

---------------------------------------------------------------------------

නිලධාරින් හතර දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතනවලට මුදාහැර නියෝජිතායතනය විසින් දීමනා වශයෙන් රු.1,142,846 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ 132 ක් වූ පුරප්පාඩු සේවක සංඛ්‍යාව අතරින් පුරප්පාඩු 96 ක් පර්යේෂණ කටයුතුවලට අදාළව පැවතීම නියෝජිතායතනයේ ප්‍රධාන කර්තව්‍ය වූ පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු ලෙස බලපා තිබුණද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 නොවැම්බර් මාසයේ සිට අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුරේ කටයුතු, වැඩ බලන නිලධාරියෙකු විසින් ආවරණය කර තිබූ අතර, එම තනතුර වෙනුවෙන් ස්ථිර නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිලධාරින් දෙදෙනෙකු අනුමත වැටුප් පරිමාණයට පටහැනිව ඉහල වැටුප් පරිමාණයක පිහිටුවීම නිසා 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.1,741,540 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ දින 119 ක ප්‍රමාදයක් සහිතව එනම් 2016 ජුනි 28 දිනය. තවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

------------------------

පර්යේෂණ හා මිනුම් කටයුතු කිරීම සඳහා ඉදිකර තිබූ යාත්‍රාවේ පැයක පිරිවැය අවම කිරීම සඳහා හා එම යාත්‍රාවට 2013 දෙසැම්බර් 08 දින සිදුවූ අනතුර හේතුවෙන් රු.2,204,727 ක් වූ අලාභය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත්කල නිර්දේශයන් සඳහා නියෝජිතායතනයේ කළමනාකාරීත්වය විසින් උචිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

අයවැයගත ආදායම් වියදම් තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී සියයට 26 සිට සියයට 76 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. වැටුප් සැකසීමේ ක්‍රියාවලියට අයත් ප්‍රධාන කාර්යයන් එකම නිලධාරියෙකුගේ පාලනය යටතේ පැවතීම හා ගිණුම් අංශයේ තොරතුරු කාලීනව මානව සම්පත් අංශයේ තොරතුරු සමඟ සසඳා නොතිබීම කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.